සන්නස SANNASA



Shyamon Jayasinghe




# DENMARK ON FIRE

## DENMARK ON FIRE

"Anyone can become angry-that is easy. But to be angry with the right person, to the right degree, at the right time, for the right purpose, and in the right way- this is not easy" Aristotle, The Nicomachean Ethics

The Danish cartoonist had no inkling that hell would break loose because of his exercise of free expression. Muslim adherents world over have set on fire anything they spotted as Danish. There is an ongoing offer of dollar one million for the head of the cartoonist. While the charge about caricature is not clear, it was the representation of Prophet Mohammed in a cartoon that brought the uproar, the passion, and the ultra heat;

All this might sound stupid to the average Western mind that has found little of sacrilege in making a joke of Jesus Christ Himself. A Buddhist writer in Sri Lanka, Asoka Weerasinghe, pertinently raised the issue of the Bamyan statues- very ancient icons of Afghanistan's Buddhist past going back to the first century AD. Asoka recalls the situation when Taliban Muslims in Afghanistan had destroyed these sacred relics of Buddhists. Muslim leaders hardly bothered to call foul over those acts of mindless destruction and blasphemy. Buddhist leaders did little more than lodge their protest in civil terms. Again, when a restaurateur in Colombo sold a soup which was named "Buddha jumped over the wall" Buddhists did not take offence.

The comparison with Buddhist responses reveals a sharp difference in world views of the two sets of religionists.

We cannot defend the Danish cartoonist on the grounds of free expression. On the other hand, campaigns of protest over this particular incident are open to the charge of inconsistency and for this reason they look bizarre. There appears to be an Aristotelian inappropriateness that cries for deeper explanation. There are many things hidden from the normal senses of human beings. In things physical, such invisibles are most often detectible by recourse to scientific instruments like Scanning Electron Microscopes, X-rays, Hubble Space Telescopes etc and fibre optics. On the other hand, hidden behavioural dynamics must be speculated upon by the use of Freudian principles. Underneath the widespread and intense Muslim conflagration was a deep belief that the Christian West wants to dominate the world and to mock at Islamic values.

## OUR LIMP CRICKET

Sri Lankans in Australia who watched their cricketers play might take solace by the consideration that the team of hapless young men had won two matches against Australia and two against South Africa and reached the final of the VB Trophy. However, that appeared to be a mere statistic when observing our boys at play at the final. It was a poor display of captaincy, bowling and fielding that led to the disastrous rampage by Aussie batsmen who simply hammered our fellows out of shape to reach their goal with nine wickets in hand. We have a long way to go before we can be fit for the World Cup.

Cricket is a game that demands sound physical fitness and endurance in the field. See how the Aussies run, bend, and jump about for hours on unending! Even after a hundred and fifty, Andrew Symonds looked ready for yet another innings. Sanath Jayasuriya looked exhausted after a fifty with a cramp-bound leg and an inability to keep running like a rabbit. Age is telling on him despite his occasional brilliance. Even the younger players are not that fit as seen in their running between wickets and in their slowness and lack of agility on the boundary line. One can see the early tiredness of our players in their body language. Australian cricketers have to follow a mandatory ongoing program of fitness involving regular testing and monitoring. Selection procedures are so tough here that even high profile players who are found unfit are eliminated from a game. Australian training schedules also include a recognition of the mind - game behind the external physical game. The latter has been a blind spot for our cricketers who are known to panic or fold up (perahera effect) when events temporarily look unfavourable. As long as the new body known as Sri Lanka Cricket fails by these professional criteria, our cricketers are not going to be competitive in a global sense. The news we have about our cricket administration itself is not something that can give us hope. It was more than a bit embarrassing to hear commentator Peter Roebuck suggest that henceforth the Australian summer series like the one that was held should open the doors to real first class cricket.




ශ්‍රී ලංකාවෙන් මේ රටට සංක්‍රමණය වුණ සිංහල උප සමාජ කුලකයේ කලා කටයුතු, සංස්කෘතික අංග ගැන පුදුම ප්‍රබෝධයක් තියෙන්නෙ. සෑම සති අන්තයකම පාහේ මෙල්බර්න් නුවර කුමන හෝ සිංහල හමුවක් පැවැත්වෙනවාමයි. ඒත් පළවෙනි පරම්පරාව මුල්වෙලා කරන කියන දේවල් තමයි වැඩිය අහන්න දකින්න ලැබෙන්නෙ. අනාගත සිංහල දරු දැරියන්ට මේ දේවල් හඳුන්වා දෙන්නත් දැන් දැන් අපේ වැඩිහිටි පිරිස යුහුසුළු වෙන බව දකින්න ලැබීම සතුටක්. නොමිලයේම තමන්ගේ කාලය, ශ්‍රමය වැය කරගෙන දරුවන් වෙනුවෙන් කැපවලා ඉන්න දිරිය වනිතාවක සමඟ කතාබහක හෙදෙන්නට ''සන්නසට'' ඉඩකඩ ලැබුණා. චැනල් 31 ඔස්සේ ඉරු දිනවල දී පෙ.ව. දහයත් එකොළහත් අතර විකාශනය වන Sri Lankan Morning Show වැඩසටහන වෙනුවෙන් මාසිකව ඉදිරිපත් කෙරෙන ළමා අංගය කාගේත් සිත් ගත් අපූරු අංගයක්. එය ඉදිරිපත් කරන වනිතාව විනීතා විජේරත්නයි. සතියේ දිනවල සිය වෘත්තියේ කටයුතුත්, දිනපතා කෙරෙන ගේ දොර දුවා දරුවන්ගේ කටයුතුත් අතරින් ලේබණ කටයුතු කෙරෙහි ද යොමු වී සිටින විනීතාගේ අවිවේකී දවසකින් හෝරාවක් 'සන්නස' සොරා ගත්තා.

''ඇත්තටම මේ ළමා වැඩසටහනට මූලික පදනම වුණේ මම ලියපු ''නාමල් අරණ'' කියන නවකතාව. ඇය පිළිසඳරට මුල් පිරුවේ වැඩසටහනට මුල පිරූ තැනින්මයි. මේ කාතව කියවපු අය අතරින් ජගත් ජේ. එදිරිසිංහ, වරුණ සාවින්ද, පාලිත ගනේවත්ත වගේ හුඟක් දෙනෙක් ඉල්ලා හිටියා මට පුවත්පත්වලට ලියන්න කියලා. නමුත් වැඩිහිටියන්ට ඒ අවස්ථාව වැඩියෙන් තියෙන නිසා මට හිතුණා ළමයින් වෙනුවෙන් සාහිත්‍යමය අගයක් ඇති යමක් කළොත් හොඳයි කියලා. ඇත්තටම ඒ අදහස ක්‍රියාත්මක කරන්න වැඩියම ඕනකම තිබුණේ සරත්ට'' සරත් නමින් ඈ හැඳින්වූයේ සිය ප්‍රියාදර සැමියා, සරත් විජේරත්නය.

''මේ අතරේදී නිමල් ජයලත් මහත්මයාගෙන් ආරාධනාවක් ලැබුණා රූපවාහිනියේ ශ්‍රී ලංකා මෝර්නිං ෂෝ එකේ නාමල් අරණ නව කතාව ගැන සාකච්ඡාවක් කරන්න. සාකච්ඡාව ඉවර වුණාට පස්සේ එතන හිටපු නිමල් අල්විස්, සුගිතා අල්විස් වගේ අය කීපදෙනෙක් එක්ක සුහද පිළිසඳරක යෙදිලා ඉන්න වෙලාවකයි නිමල් අල්විස්ගේ කටින් පිටවුණේ රූපවාහිනී ළමා වැඩසටහනක් ගැන. ළමයින්ට පත්තරවලට ලිව්වාට සිංහල කියවන්න තියෙන අපහසුකම නිසා රූපවාහිනී මාධ්‍යය ඒකට හොඳ පිළියමක් බව සරත්ටයි මටයි වැටහිලයි තිබුණේ. ''එදරබසබට ̄යදඅ.. වැඩසටහන අධ්‍යක්ෂණය , සංස්කරණය සහ නිෂ්පාදනය කෙරෙන්නේ නිමල් අල්විස් අතිනි. ''ඇත්තටම රමණී ලියනආරච්චි අක්කාත්, ජයශ්‍රීත් මුලදී මාව හරියට දිරි ගැන්නුවා.'' ජය ශ්‍රී චන්ද්‍රජිත්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ''සිංහබාහු'' වේදිකා නාට්‍යයේ සිංහයාගේ භූමිකාව රඟ පෑ ප්‍රවීන රංගන ශිල්පියායි.

''ඉතින් කොහොමද? වැඩසටහන ගොඩනගා ගන්න ඔබ කටයුතු කළේ?'' ''සන්නස'' විනිතාගෙන් ඇසුවා.

''සමන් රණබාහුගේ සංගීත කුසලතාවය ගැන මම එතකොටත් දැනගෙනයි හිටියෙ. පසුතල නිර්මාණය කරන්න සරත් ඉදිරිපත් වුණා. සිංහල පාසැලක ගුරුවරියක් වුණ රමණි අක්කා උදව් වුණා නොයෙක් විදියට. මුලින්ම දන්න කියන අයගෙන් තමයි පටන් ගත්තේ. ඇත්තටම හිතුවාට වැඩිය බොහෝම ඉහළ ප්‍රතිචාර මුල් වැඩසටහන් බලපු අයගෙන් ලැබුණා.'' විනිතාගේම අදහස් අනුව රචනා වී ඉදිරිපත් කෙරෙන මෙම වැඩසටහන සම්පූර්ණයෙන්ම පුහුණු කරනු ලබනුයේ ඇය විසින්මයි. අදාළ මාසයට විශේෂිත අංගයක් තෝරා ගැනීමට ඇය සැමවිටම උත්සාහ කරනවා. කථාවක් හෝ සිද්ධියක්, ගීයක්, නර්තනයක්, රංගනයක් සමඟින් දැනුමද වැඩි දියුණු කරමින් අවසානයේ සමාජයේ මූලික හරයන් හා සාරධර්ම ඇසුරින් උපදේශාත්මක යමක් දරුවනට පිළිගැන්වීමයි ඇයගේ එකම අරමුණ. ''මේ රටේ අපේ ළමයින්ගේ ජීවිතවලටත් මේ දේවල් හුරු කරන්න ඕන කියලයි මම හිතන්නෙ. ඇත්තටම ළමයින්ව හසුරුවාගෙන පුහුණු කරන්න පුදුම ඉවසීමක් තියෙන්න ඕන. සති දෙකක කාලයකුයි පුහුණුවට ලැබෙන්නෙ. පිටපත ලියන්න, පසුතල හදන්න, ඇඳුම් පිළියෙල කර ගන්න, නැටුම් නිර්මාණය කර ගන්න, අවශ්‍ය වාදන භාණ්ඩ ළං කර ගන්න, මේ හැම-දෙයක්ම ගැන හිතන කොට ලේසි නෑ.''

''කෑම පැයේ දී තමයි ලියන්නේ. දවස් දෙක තුනක් රෑ නිදි වරන්නත් වෙනවාමයි. හැබැයි ඉතින් දරු-වන්ගේ දෙමව්පියන් දෙන සහයෝගයේ වටිනාකමනම් කියලා නිම කරන්න බෑ. පුහුණුවීම් කෙරෙන්නේත් ඒ ඒ අයගේ ගෙවල්වල. කෑම බීම පවා එයාලා අතින් සැපයෙනවා ඒ දවස්වලට.'' මීට අමතරව වේෂ නිරූපනය සඳහා සුබිතා අල්විස්, නැටුම් පුහුණු කිරීම් සඳහා මනිෂා අරඹෙවෙල, බෙර වාදනයට මංජුල සමරපති, තබ්ලා වාදනයට රෝහිත උඩවෙල, බටනලා වාදනයට හා ගී රචනයට සිසිර දිසා-නායක යන පිරිසගෙන් ලැබෙන සහයෝගයද සිහිපත් කරන්නට ඇය අමතක කළේ නෑ. සෑම මාසයේ සෑම අවසන් ඉරිදාවකම එදරබසබට ̄යදඅ වැඩසටහනේ මල් අතරින් විනාඩි පහළොවකට සුපිපෙන විනිතා පිළිසඳර නිමා කළාය.

**සාකච්ඡා කළේ : අවිස්සාවෙල්ලේ කුමාර**